කොළඹ දිසා අධිකරණයේ දී ය.

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක. 167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

පැමිණිලිකරු.

නඩු අංකය: 21819/එම්.ආර්.

- එදිරිව -

1. ගාමිණී ලක්ෂ්මන් පීරිස්,
"විසුම්පාය", ස්ටේපල්ස් වීදිය,
කොළඹ 2 සහ අංක. 37,
කිරුළ පෙදෙස, කොළඹ 5.

2. හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්
කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ
එච්ලන් චතුරශ්‍රය, ලෝටස් පාර,
කොළඹ 1.

විත්තිකරුවන්.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ (95 වන වගන්තිය සමඟ කියවිය යුතු) 94 වන වගන්තිය යටතේ ඉහත නම සඳහන් 1 වන විත්තිකරුගෙන් විචාරීම සඳහා "X1" යනුවෙන් ලකුණු කොට මෙයට අමුණා ඇති ආකෘතියේ ඇතුළත් වන විචාරණ අධිකරණය මාර්ගයෙන්, යැවීම පිණිස අවසර දෙන ලෙස ගරු අධිකරණයෙන් ඉල්ලා සිටිමි. මෙම විචාරණවලට ඒවා භාර කරනු ලැබීමෙන් දින දහයක් තුළ දී උත්තර සපයන ලෙස 1 වන විත්තිකරුට නියම කරමින් ඔහුගේ ලේඛණගත නීතිඥවරුන් මගින් ඒවා ඔහු වෙත භාර කරනු පිණිස අවසර දෙන ලෙසද ගෞරවයෙන් ඉල්ලමි.

තව ද එකී විචාරණ ආපසු කැඳවීම සඳහා ඉතා ලඟ දිනයක් නියම කිරීමට ද ගරු අධිකරණය කාරුණික වන ලෙස ඉල්ලා සිටිමි.

තව ද පැමිණිලිකරුගේ නීතිඥ මහතාට මෙම මෝසම තහවුරු කර සිටීමට හැකි වනු පිණිස මෙම නඩුව 1999 අප්‍රේල් මස 29 වන දින කැඳවන ලෙස ද මම අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

1999 ක්වූ අප්‍රේල් මස 28 වන දින කොළඹ දී ය.

Desilva

පැමිණිලිකරුගේ නීතිඥ.

කොළඹ දිසා අධිකරණයේදීය.

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක.167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ - 10.

පැමිණිලිකරු

නඩු අංකය :- 21819/එම්.ආර්.

එදිරිව

1. ගාමිණි ලක්ෂ්මන් පීරිස්,
   "විසුම්පාය", ස්ටේපල්ස් වීදිය,
   කොළඹ - 2.
   සහ අංක.37, කිරුළ පෙදෙස,
   කොළඹ - 5.

2. හොටේල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
   කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ,
   එච්ලන් චතුරශ්‍රය, ලෝටස් පාර,
   කොළඹ - 1.

විත්තිකරුවන්

ඉහත නම සඳහන් 1 වන විත්තිකරු වෙනය,

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 95 වන වගන්තිය යටතේ, ඔහුගේ ලේඛණගත නීතිඥවරුන් වන, කොළඹ 7 ග්‍රෙගරීස් පාරේ අංක.59 හි පෝල් රත්නායක ඇසෝෂියේට්ස් මගින් භාර දීම පිණිසයි.

ඉහත නම සඳහන් 1 වන විත්තිකරුගෙන් විචාරීම සඳහා ඉහත නම සඳහන් පැමිණිලිකරු වෙනුවෙන් විචාරණ : (2 වන විත්තිකාර සමාගම මෙහි මින්මතු "එච්ඩීඑල්" සමාගම යනුවෙන් සඳහන් කරනු ලැබ ඇත)

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 94 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් විචාරණ ඔබ වෙත භාර දී දින දහයක් ඇතුළත ඒවාට පිළිතුරු දීමට ඔබට නියම කරනු ලැබේ.

1. අභියාචනාධිකරණයේ අංක.775/98 දරණ ප්‍රතිශෝධන අයදුම්පතේ (ඔබට විරුද්ධව පැමිණිලිකරු විසින් පමුණුවා ඇති කොළඹ දි.උ. අංක.19849/එම්.ආර්. දරණ නඩුව) ඉදිරිපත් කරනු ලැබ ඇති ඔබගේ දිවුරුම් ප්‍රකාශයෙහි 8 වන ඡේදයේ :- "ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැනුම්දීමක් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(2) ව්‍යවස්ථාව යටතේ, මුදල් විෂයට අදාළව කිසියම් බලයක් හෝ කාර්ය භාරයක් මට පවරා නොමැත" යනුවෙන් ඔබ සහතික කර නොමැත්තේ ද?

2. 1994 සැප්තැම්බර් මාසයේ දී මුදල් අමාත්‍යාංශයේ උපදේශකවරයකු වශයෙන් පැමිණිලිකරු පත් කිරීමට යෙදුන විට, ඔබ, නියෝජ්‍ය මුදල් ඇමතිවරයා ලෙස සිටි බැවින් මෙන්ම ඔබ කැබිනට් අමාත්‍යවරයකුව සිටියදී ඔහුගේ එම පත්වීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි පැමිණිලිකරුගේ වෘත්තීය පසුබිම ගැන සහ ඔහු දරණ තත්වය පැහැදිලිව දක්වා සඳහන් කරනු ලැබිය යුතුව තිබුණු නිසා, ඔබ ඒ ගැන නොදැන සිටිය හැක්කේ කෙසේද?

3. ඔබ එවකට (මෙහි මතු "සෙක්" ආයතනය යනුවෙන් සඳහන් කරනු ලබන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ) සාමාජිකයෙකු වශයෙන්, වෙනත් දේ අතර, එච්ඩීඑල් සමාගම වෙනුවෙන් වූ පැමිණිලිකරුගේ කොළඹ දි.උ. අංක.3155/විශේෂ දරණ ව්‍යාත්පන්න නඩුවට, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවද ඇතුළුව අදාළ වන්නා වූ සිද්ධාන්ත සහ ලේඛණ ඔබගේ දැනගැනීමට පැමිණිලිකරු සහ/හෝ ඔහුගේ නීතිඥවරුන් වන ද සිල්වා සහ පෙරේරා මහතුන් විසින් ලිඛිත නියෝජන ගණනාවක් මගින් සැලසූ බව ඔබ පිළිනොගන්නේද?

4. බැලූ බැල්මටම වංචාවක් නිරූපිත නඩුවක් ලෙසට පැමිණිලිකරුගේ නඩුව පිළිගනිමින් 1992 දෙසැම්බර් මාසයේදී දෙන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුව මත පවා එවකට සිටි එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂකවරුන් විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් නොගැනීම හේතුකොට ගෙන, මෙම කාරණය පරීක්ෂා කර බැලීමට විශේෂ ජනාධිපති කොමිෂන් සභාවක් පත් කිරීමට යෙදුන බව ඔබ පිළිනොගන්නේද ?

5. එවකට සාමාජිකයකු වශයෙන් ඔබ ඇතුළුව "සෙක්" ආයතනය වෙත වූ ලිඛිත නියෝජනයන් මගින් එච්ඩීඑල් සමාගමේ 1990.03.31 දිනට වූ වාර්ෂික ගිණුම් වලට අදාල කොළඹ දි.උ. අංක.3231/විශේෂ දරණ නීතියෙන් තවත් ව්‍යාත්පන්න නඩුවකටද අදාළ වූ බවත් එම නඩුවේ ප්‍රතිඵලයක් වශයෙන් අධිකරණය විසින් එම ගිණුම් වාරණය කරන ලද බවත් ඔබ පිළිනොගන්නෙහිද?

6. එච්ඩීඑල් සමාගමේ කටයුතු පවත්වාගෙන යාමත් සහ එහි වාර්ෂික ගිණුම්, සංශෝධිත පරිදි වූ 1987 අංක.36 දරණ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පනතේ විධිවිධාන පරිදි සෙක් ආයතනයේ විෂය පථය තුළට ගැනෙන බව සහ එහි ඊති මගින් පාලනය වන බව ඔබ පිළිනොගන්නෙහිද?

7. (i) ඔබ නියෝජ්‍ය මුදල් ඇමතිවරයා වශයෙන් සිටියදී, මුදල් ඇමති විසින් එකී කාරණය සමාලෝචනය කරන ලදුව සෙක් ආයතනය විසින් සුදුසු ප්‍රතිකර්ම ගත යුතු බවට විධාන කර ඇති බව සඳහන් කරමින්, මේ සම්බන්ධයෙන් නිසි පියවර ගන්නා මෙන් සෙක් ආයතනයට නියම කරමින්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 1994/09/23 වන දින දරණ ලිපිය සෙක් ආයතනය වෙත යවා ඇති බව ;

(ii) එසේ කිරීමට භාර ගනිමින්, සෙක් ආයතනයේ සභාපතිවරයා විසින් 1994/10/06 දින දරණ ලිපිය මගින් ඊට පිළිතුරු දුන් බව ;

ඔබ පිළිනොගන්නෙහිද?

8. (i) හිල්ටන් සමර් ගිවිසුම්වල නත් කාරණය සම්බන්ධයෙන් නිශ්චිත කොන්දේසියක් ඇතුළත් කිරීම මාර්ගයෙන්, ව්‍යවස්ථාමය රාජකාර්යයන් හිතාමතාම පැහැර හැරීම සහ අතපසු කිරීම සඳහා වෙනත් තැනැත්තන් අතරෙහි ඔබට ද, විරුද්ධව රජය විසින් ක්‍රියාකළ යුතුව තිබෙන බව එවකට සිටි නීතිපතිවරයා වූ ජනාධිපති නීතිඥ තිලක් මාරපන මහතා විසින් සහ එවකට සිටි අතිරේක සොලිසිටර් ජනරාල් (දැන් ජනාධිපති නීතිඥ) ශ්‍රීනාත් පෙරේරා මහතා නිගමනය කළ බව ඔබ පිළිනොගන්නෙහිද?,

(ii) ඉන් අනතුරුව, සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ ඩග්ලස් ප්‍රේමරත්න මහතා ද, ඊට එකගත්වය පළ කල බව ඔබ පිළිනොගන්නේද?

9. 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ 1 සිට 4 දක්වා අංක යෙදූ හිල්ටන් සමථ ගිවිසුම් ඔබ විසින් සවිස්තරාත්මකව පරීක්ෂා නොකළේ ද?

10. (i) ඒ අනුව, සමථය ගිවිසුම් හී, නිශ්චිත වගන්තියකින් එහි පූර්ණත්වයට අවශ්‍ය වන්නා වූ කොටසක් අත්හැර, ඉන් කොටසක් පමණක් පද සම්බන්ධතාවයෙන් තොරව උපුටා දක්වමින්, 1995 අගෝස්තු මස 08 වන දින පාර්ලිමේන්තුවේදී ඔබ ප්‍රකාශයක් කරනු ලැබුවේ නැද්ද ? එමගින් එය පාර්ලිමේන්තුවට සහ එමගින් මහජනතාවට අසත්‍ය සහ නොමග යවන සුළු ප්‍රකාශයක් නොවන්නේද?

(ii) එහි මැද කොටස පමණක් හුවා දක්වමින් එම ඡේදයෙහි පහත සඳහන් පළමු සහ අවසන් කොටස් ඔබ විසින් හිතාමතාම යටපත් කර සහ/හෝ අත්හැර දැමුවේ නැත් ද?

*"Whereas in the context of the promotion of the Colombo Hilton Hotel and/or Hotel Developers (Lanka) Ltd., Nihal Sri Ameresekere (hereinafter referred to as "Mr. Ameresekere") of 167/4, Sri Vipulasena Mawatha, Colombo 10, having been induced by the main promotors thereof to get involved and/or concerned in the affairs of Sun-Cornel Textiles Ltd., and the Colombo Apothecaries Co. Ltd., and in consideration of the settlement initiated by the Government and the write-offs, reductions and rescheduling referred to in Agreement No.1, the Government as the major Shareholder and Guarantor, being a beneficiary thereof and further in the context of the conditions stipulated in Clause 9 in the Agreement No. 4 shall and will assist Mr. Ameresekere ..............................................*

..............................................................................................................

**[middle part only quoted to Parliament]**

(මැද කොටස පමණක් පාර්ලිමේන්තුවේ හුවා දැක්වූවේය)

..............................................................................................................

*........ and whereas in some of the said Actions, Mr. Ameresekere had been added and/or had been moved to be added as a party and/or an accused only after the institution of the litigations referred to in the aforesaid Agreement No. 3, to which this Annexure "Y" relates"*

(iii) එමගින් ඔබ විසින් පාර්ලිමේන්තුවට කරන ලද්දේ අසත්‍ය සහ නොමග යවන සුළු ප්‍රකාශයක් නොවන්නේද?

11. සමථ ගිවිසුම්වල, විශේෂයෙන්ම ඔබ විසින් එලෙස නොමඟ යවන සුළු අන්දමින් සඳහන් කරන ලද අංක.3 දරණ ගිවිසුමෙහි පූර්විකාවෙහි, ජපන් සමාගම්වල ඉල්ලීම පිට, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, එවැනි සමථයක් ඇතිකර ගැනීමේ අදහසින් පැමිණිලිකරු සමඟ සාකච්ඡා කිරීමට ඉදිරිපත් වූ බව සඳහන් කර ඇති බව ඔබ පිළිනොගන්නෙහිද?

12. එකී අංක.3 දරණ එම ගිවිසුමෙහි ම, වෙනත් දේ අතර -

පැමිණිලිකරු විසින් කරන ලද නියෝජනයන් මත ඔවුන්ගේ කල්ක්‍රියාව සහ ක්‍රියාකලාපය ගැන ඔබද ඇතුලුවන, සෙත් ආයතනයේ එවකට සාමාජිකයන්ට එරෙහිව රජය විසින් ක්‍රියා කළයුතු සහ ක්‍රියා කරනු ලබන බවට කොන්දේසියක් එම අංක.3 දරණ සමථ ගිවිසුමේ අඩංගු වූන අතර, පැමිණිලිකරු විසින් ක්‍රියාමාර්ගයක් ඉදිරියට ගෙන යෑමේ අයිතියද ඔහු විසින් රඳවා ගත් බව ඔබ පිළිනොගන්නේද?

13. මුදල් අමාත්‍යවරයා විසින් 1995 ජූනි මස 21 වන දිනට කලින් අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු පැහැදිළි කර තිබුණු අතර, 1995 ජූනි මස 28 වන දින හෝ ඊට ආසන්න දිනකදී අමාත්‍ය මණ්ඩලය විසින් මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද එකී හිල්ටන් සමථය පිළිබඳ 1995 ජූනි මස 21 වන දින දරණ කැබිනට් සන්දේශය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද බව ඔබ පිළිනොගන්නේද?

14. ලියා අත්සන් කිරීමට නියමිත සමථ ගිවිසුම් සොලිසිටර් ජනරාල්වරයා විසින් නිමකර තිබෙන බවත්, එකී සමථය ගැන සොලිසිටර් ජනරාල්වරයා විසින් විශේෂ ජනාධිපති කොමිෂන් සභාව දැනුවත් කර ඇති බවත්, එකී කැබිනට් සන්දේශයෙහි සඳහන් කර ඇති බව ඔබ නොපිළිගන්නෙහි ද?

15. එකී අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි, වෙනත් දේ අතර, මෙසේ සඳහන් කර තිබුණු බව ඔබ පිළිනොගන්නෙහිද?

(i) "ඉනික්බිති 1992 දෙසැම්බරයේදී අග්‍ර විනිශ්චයකාරතුමා විසින් මූලසුන දැරූ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දිසා අධිකරණය විසින් නිකුත් කරන ලද අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝග ස්ථිර කර සිටින ලදී. ඒ නඩු තීන්දුව ප්‍රකාශයට පත් කරමින්, බලවත් විත්තිවාචකයක් ඉදිරියෙහි පවා, අමරසේකර මහතා විසින් සාධාරණ වූද, සාර්ථකත්වය පිළිබඳ යථාර්ථ බලාපොරොත්තුවක් සහිත වූද, බලගතු බැලූ බැල්මට පෙනෙන නඩුවක් තහවුරු කර ඇති බවත්, අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝග නිකුත් කරනු ලැබ ඇත්තේ අති විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වඩා ලෙස මෙරටින් වෙන'තකට හැරවීම සඳහා බවත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිරීක්ෂණය කරන ලදී."

(ii) "ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්වකීය නඩු තීන්දුවෙහි වෙනත් දේ අතර, තමාදුරටත් විශේෂයෙන්, සඳහන් කරන ලද අවස්ථාගත කරුණු අනුව, ආණ්ඩුව බහුතර කොටස්හිමියා සහ ඇපකරු වන බැවින්, මෙය, මුළුමනින්ම රජයට දැක් වූ උදාසීනත්වය පිළිබඳ කාරණයක් විය නොහැකිය. දක්වා ඇති කරුණු අනුව, ක්‍රියාමාර්ගයක් ගත යුතුව තිබුණේ රාජ්‍ය අරමුදල් මත බර පැටවීමක් වන රජය විසින් ඇප වූ විශාල ප්‍රමාණයේ ණය සහිත වූද, රජය විසින් අයිතිය දරන්නා වූද, එකී සමාගම වෙනුවෙන් ක්‍රියා කරමින් තනි කොටස්හිමියකු වශයෙන්, සාමාන්‍ය පුරවැසියකු වූ අමරසේකර මහතා විසින් නොව, රජය විසින් මය".

16. ඔබ විසින් 1995 අගෝස්තු මස 08 වන දින පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශයෙහි, පැමිණිලිකරු විසින් හිල්ටන් හෝටල ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකරුට විරුද්ධව පැවරීමට යෙදුනු සංසන්දනාත්මකව නොවැදගත් නඩු කිහිපයක් ගැන ඔබ විසින් විශේෂයෙන් සඳහන් කර තිබුණු බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද? <u>ඒ නඩු පැමිණිලිකරුට විරුද්ධව පැවරීමට තුඩු දුන් නිශ්චිත ආකාරය සහ පැමිණිලිකරුට සහාය වීමට ආණ්ඩුව බන්ධනය වූයේ කුමක් නිසාද</u> යන වග සඳහන් වන ඒ ඡේදයේ ඊට අදාළ කොටස ඔබ විසින් හිතාමතාම යටපත් කළ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද? එමගින්, මත භේදයක් ඇති නොවූයේද?

17. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද 1995 ජූනි මස 28 වන දිනැති එකී අමාත්‍ය මණ්ඩල සංදේශයේ වෙනත් දේ අතර මෙසේ සඳහන් නුවූයේද?

"මේ කාරණය සමස්තයක් වශයෙන් ගෙන ඒ පිළිබඳව විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් පරීක්ෂණයක් පවත්වන අතර ඒ මත වාර්තාවක් රජයට සහ මහජනයාට සපයනු ලැබේ. කොමිෂන් සභාවේ තීරණ සහ නිර්දේශ පදනම් කරගෙන උචිත ක්‍රියා මාර්ගයක් ගැනීම රජය විසින් සළකා බලනු ඇත. මේ සමථය ගැන සොලිසිටර් ජනරාල්වරයා විසින් කොමිෂන් සභාව දැනුවත් කොට ඇත."

18. 1995 ජූනි මස 30 වන දින පුවත්පත් සාකච්ඡාවේදී ඔබ මෙසේ ප්‍රකාශ කළේ නැද්ද ? - "කෙසේ වුවද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සහ අල්ලස් හා දූෂණය පිළිබඳ ස්ථිර කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන වරදකරුවන්ට විරුද්ධව නෛතික ආයතන මගින් ගනු ලබන ක්‍රියා වලට මේ සමථයේ කිසිම සම්බන්ධයක් නැත."

19. විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සහ අල්ලස් හා දූෂණ පිළිබඳ ස්ථිර කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන වරදකරුවන්ට විරුද්ධව අධිකරණ අමාත්‍යවරයා වශයෙන් නෛතික ආයතනය මගින් ගැනීමට සැලැස් වූ අශෝභන ක්‍රියා මාර්ග මොනවාද ?

20. (i) 1995 ජූලි මස 25 වන දිනැති "ඩේලි නිව්ස්" පත්‍රයේ වාර්තා කර ඇති පරිදි ඔබ පුවත් වලට මෙසේ ප්‍රකාශ කළේ නැද්ද?

"විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් පවත්වන හිල්ටන් කාරණය පිළිබඳව පරීක්ෂණය නිමවන තෙක් සමථයෙන් අදහස් කර ඇති ගෙවීමක් සිදු කිරීම හෝ සමථයේ වෙනත් යම් අංශයක් කවර හෝ ආකාරයකින් ක්‍රියාත්මක කිරීම හෝ කරනු නොලැබේ".

(ii)/

(ii) ඔබට විරුද්ධව පැමිණිලිකරු විසින් පවරනු ලැබ ඇති කොළඹ දි.උ. අංක.19849/එම්.ආර්. දරණ නඩුවේ ඔබගේ 1997/10/31 දිනැති උත්තරයෙහි මෙය පිළිගෙන නොමැත්තේද?

21. (i) 1995 අගෝස්තු මස 08 වන දින පාර්ලිමේන්තුවේදී ඔබ විසින් ප්‍රකාශ කළේ නැද්ද ?

"මේ කාරණය පිටුපස ඇති සිද්ධි හෙළි කිරීමට මැතිවරණ ව්‍යාපාරයේදී පොදු ජන එක්සත් පෙරමුණ පොරොන්දු වූ අතර එම පොරොන්දුව ඉටු කිරීම් වස් ගනුදෙනුව පිටුපස ඇති අවස්ථාගත කරුණු පිළිබඳව පරීක්ෂණ කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කරන ලදී. මේ කොමිෂන් සභාව විසින් මේ කාරණා පිළිබඳ පරීක්ෂණ දිගටම පවත්වන බවද, මේ රටේ නීති යටතේ වරදකරුවන්ට විරුද්ධව කටයුතු කරන බවට සහතික වීමට අවශ්‍ය සියලු පියවර රජය විසින් ගන්නා බවද, නැවතත් ප්‍රකාශ කළ යුතුය".

"කෙසේ වුවද හිල්ටන් ව්‍යාපෘතිය පිටුපස ඇති උද්දේශිත වංචාව සහ අනිසි ක්‍රියා වලට අදාළ අවස්ථාගත කරුණු ගැන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සොයා ගන්නා කරුණු ගැන කටයුතු කිරීම ප්‍රමාද කිරීමට හෝ එම කටයුතු පසෙක තැබීමට කිසිම අවස්ථාවක කිසිම චේතනාවක් හෝ අදහසක් නොතිබූ බව ද, කොමිෂන් සභාව විසින් යම් වැරදි ක්‍රියාවක් සොයා ගනු ලැබුවහොත්, හෝ එවැනි ක්‍රියාවක් බව තීරණය කලහොත් රටේ නීති යටතේ එම ක්‍රියා සම්බන්ධයෙන් තදින් කටයුතු කිරීම රජයේ අදහස වශයෙන් දිගටම පැවති බව ද, නැවතත් ප්‍රකාශ කළ යුතුය".

(ii) නැවත 1995 සැප්තැම්බර් මස 19 වන දින ඔබ පාර්ලිමේන්තුවට පහත සඳහන් අයුරු ප්‍රකාශ කළේ නැතිද ?

"හිල්ටන් ව්‍යාපෘතිය පසුපස සිදු වී ඇතැයි කියනු ලබන වංචා සහ අයථා ක්‍රියාවන්ට අදාළ වන්නා වූ තත්ත්වාකාරයන් තුළට විශේෂ ජනාධිපති කොමිෂම විසින් පවත්වා ගෙන යනු ලබන පරීක්ෂණ කෙරෙහි භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සමථය ගිවිසුම් අත්සන් කිරීම, කිසිසේත්ම බලපෑමක්, අඩපණ වීමක් හෝ විපාකයක් සිදු නොවනු ඇත හෝ සිදු නොවිය යුතුය, වරද සිදු කිරීමක් කොමිෂම විසින් අනාවරණය කර ගනු ලැබුවහොත් හෝ සොයාගත හොත්, වරදකරුවන්ට එරෙහිව රටෙහි නීති යටතේ දැඩිලෙස ක්‍රියා කිරීමේ රජයේ අරමුණ එලෙසම පවතින්නේය".

(iii) ව්‍යවස්ථාපිතව ඔබ විසින් කළ යුතුව තිබෙන පරිදි එකී උද්දේශිත වංචා/අකටයුතු ක්‍රියා පිළිබඳව සෙක් ආයතනයේ අනිකුත් සාමාජිකයන්ද ඇතුළු ඔබ ක්‍රියාමාර්ගයක් නොගත් බව ඔබ පිළිනොගන්නේ ද ?

22. (i) පැමිණිලිකරුගේ ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති කරගත් හිල්ටන් සමථය රජයට සහ රටට ඉමහත් ලෙස වාසි සහගත වූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) පැමිණිලිකරුට අදාළ වූ එක් කොන්දේසියක් රජයට පිළිගත නොහැකි කොන්දේසියක් වශයෙන් අවධාරණයෙන්ම සඳහන් කර, 1995 අගෝස්තු මස 08 වන දින පාර්ලිමේන්තුව, එමගින් මහජනයා නොමඟ යැව්වේත්, එයින් ඊට අදාළ සම්පූර්ණ කරුණුත්, වුවමනාවෙන්ම වසන් කරමින් සහ අනාවරණය නොකරමින් ඔබ උත්සාහයන් දැරුවේ මන්ද?

(iii) රු.මිලියන 10,200 ක කපා හැරීමක්ද සහිතව, ඉතිරි ණය මුදල වර්ෂ 2010 තෙක් තවත් වසර 15 පුරා අඩු පොලියකට ගෙවීමට නැවත ප්‍රතිලේඛණගත කිරීමක් සලස්වමින් රජයට සහ රටට ඉමහත් ලාභ ප්‍රයෝජනයක ප්‍රතිඵලයක් වූයේ පැමිණිලිකරුගේ ධෛර්යවන්ත තනි ප්‍රයත්නය නිසා නොවන්නේ නම්, කවුරුන්ගේ ප්‍රයත්නයක් නිසාද?

(iv) එච්ඩීඑල්/හිල්ටන් හෝටලය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස පැමිණිලිකරු/පැමිණිලිකරුගේ නීතිඥයන් විසින් කරන ලද නොයෙකුත් කරුණු නියෝජනය කර පෙරන්න කිරීම නොතකමින් ඔබ සෙක් ආයතනයේ එවකට සාමාජිකයකු වශයෙන් කවර අන්දමේ හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම පැහැර හැර සහ අතපසු කර ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද?

23. (i) වෙනත් දේ අතර, එම දිනය ඔබගේ ජීවිතයේ ප්‍රීතිමත්ම දිනය බව කියමින් සමථය සඳහා ප්‍රසංශාව ඔබ ලබා ගනිමින් සමථය ඔබේ හෝ රජයේ ජයග්‍රහණයක් බව පෙන්වා සිටිමින් ඔබ කීර්තියෙන් නැහැවෙමින් පැමිණිලිකරුට නීත්‍යානුකූලව හිමි ගෞරවය පැමිණිලිකරුගෙන් සොරා ගනිමින්,

(ii) "ජපන් කොන්ත්‍රාත්කරුවන් සමඟ අත්සන් කරන ලද සමථය ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසාකෑම මර්ධනය කිරීමේ පොදු පෙරමුණ රජයේ මැතිවරණ ප්‍රකාශනයේ ප්‍රධාන ප්‍රතිපත්ති වලට සහ විශාල ප්‍රමාණයේ ඉතිරිවීමක් ඇති කරගෙන ඇති රජයේ කැප වීමට අනුකූල වන බවත්,

1995 ජූලි මස 30 වන දින හෝ ඒ ආසන්නයේදී පුවත්පත් සාකච්ඡාවේදී ඔබ ප්‍රකාශ කළ බව ඔබ පිළිනොගන්නෙහිද ?

(iii) එසේ ප්‍රකාශ කිරීමට හිල්ටන් සමථය පිළිබඳ අතීත පසුබිම සහ ඊට අදාළ අවස්ථාගත කරුණු ඔබ දැන සිටිය යුතු නොවන්නේද?

24. (i) ඔබ ප්‍රකාශ කර ඇති පරිදි ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසාකෑම වළක්වා ගැනීම සඳහා පැමිණිලිකරු විසින් ඔවුන්ට දන්වා තිබූ නොයෙකුත් බරපතල කාරණා ගැන ක්‍රියාමාර්ගයක් ගැනීම එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම විය යුතුව තිබූ බව ඒ අනුව ඔබ පිළිගන්නේ නැද්ද ?

(ii) ඔබ විසින් එසේ ප්‍රකාශ කර ඇති පරිදි දැන සිටි බරපතල සංස්ථාගත කරුණු යටතේ ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසා කෑම වැළැක්වීම සඳහා පැමිණිලිකරු විසින් ෆෝර්ඩ් රෝඩ්ස් තෝර්න්ටන් සමාගමේ විගණකවරුන්ට දන්වා තිබූ ආකාරයට, එම විගණකවරුන් එච්ඩීඑල් සමාගමේ වාර්ෂික ගිණුම් සහතික කිරීමෙන් වැළකී සිටිය යුතු වූයේ යැයි ඔබ පිළිගන්නේ නැද්ද ?

(iii)/

(iii) 1990 සිට පැමිණිලිකරු විසින් අනාවරණය කළ/හෙළි කල බරපතල අවස්ථාගත කරුණු අනුව ප්‍රධාන කොටස්කරු සහ ඇපකරු වන රජය ඉක්මන් සහ ඵලදායී ක්ෂණික ක්‍රියාමාර්ගයක් ගත්තේ නම් ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසාකෑම එසේම වළක්වන්නට තිබුණේ නැද්ද ?

(iv) ඔබ විසින් පිළිගත් පරිදි එච්ඩිඑල් සමාගම සෙත් ආයතනයේ ඇති නියෝග මලින් පාලනය වන නිසා එම රීති සහ නියෝග උල්ලංඝනය කෙරෙන බරපතල විෂමාචාර කිහිපයක් පැමිණිලිකරු විසින් සෙත් ආයතනයේ සාමාජිකයකු වශයෙන් ඔබ ද ඇතුළුව, එවකට එකී සාමාජිකයන්ට ජාතික සම්පත්වල එකී කොල්ලකෑම සහ ගසාකෑම වළක්වා ගැනීම සඳහා, ඔබ විසින් එසේ ප්‍රකාශ කර ඇති පරිදි, ක්‍රියා මාර්ගයක් ගත යුතුව තිබුනු බව ඔබ පිළිගන්නේ නැද්ද ?

(v) සෙත් ආයතනයට සහ එහි සාමාජිකයකු වශයෙන් ඔබට නොයෙකුත් කරුණු නියෝජනය කිරීමේ අවස්ථාගත කරුණු යටතේ ජාතික සම්පත් එසේ කොල්ලකෑමට සහ ගසා කෑමට අදාළ අවස්ථාගත කරුණු සහ සිද්ධි සෙත් ආයතනය හොඳින් දැනසිටි බව ඔබ පිළිගන්නේ නැද්ද ?

25. (i) නියෝජ්‍ය මුදල් ඇමතිවරයා වශයෙන් ඔබ විසින් විධාන කර තිබූ ආකාරයට මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් මිට්සූයි සහ තායිසේ වෙත 1995/07/25 දින දරණ ලිපි ලියා ඇති බව ඔබ පිළිනොගන්නෙහිද?

(ii) විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් පරීක්ෂණයේ තීරණය දෙන තෙක් සමථය ක්‍රියාත්මක නොකරන බව එකී ලිපිවල ප්‍රකාශ කර ඇති බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද?

(iii) විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් පරීක්ෂණය තවමත් නිමකර සහ නිශ්චය කර නැති බව ඔබ ප්‍රතිසෙෂ්ප කරන්නේද?

(iv) විශේෂ ජනාධිපති පරීසෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් පරීසෂණය නිමකර තීරණය කිරීමට පෙර 1996 ඔක්තෝබර් මාසයේදී හිල්ටන් සමථය ක්‍රියාත්මක කළ බව ඔබ ප්‍රතිසෙෂ්ප කරන්නේද?

26./

26. (i) 1995 ජුලි මස 25 වන දින ඩේලිනිවුස් පත්‍රයේ වාර්තා කළ ආකාරයට හිල්ටන් සමථය අත්හිටවීම නිවේදනය කිරීමේදී විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් කාරණය පිළිබඳ පරීක්ෂණය නිමකරන තෙක් සමථය කෙසේවත් ක්‍රියාවේ නොයෙදවන බවට ඔබ ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) 1996 ඔක්තෝබර් මාසයේ දී සමථය ක්‍රියාත්මක කර බලාත්මක කරනු ලැබූ විට, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් පරීක්ෂණය නිමකර තීරණය කරන තෙක් හිල්ටන් සමථය ක්‍රියාත්මක නොකිරීමේ ඉහත කී ස්ථාවරය ඉවත් කර ගැනීම පිළිබඳව කිසිම ප්‍රසිද්ධ ප්‍රකාශයක් හෝ පැහැදිලි කිරීමක් ඔබ විසින් නොකළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) ඔබ විසින් 1995 අගෝස්තු මස 8 වන දින පාර්ලිමේන්තුවේදී පිළිගත් පරිදි නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා වශයෙන් හිල්ටන් සමථය ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම ඔබ විසින්, මුදල් අමාත්‍යවරයා වශයෙන් ජනාධිපති කුමාරතුංග මැතිනිය සමග මැදිහත් වීමෙන් සිදුකළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

27. (i) නීත්‍යානුකූලව සහ ගිවිසුම්මය වශයෙන් එළඹෙන ලද එකී සමථ ගිවිසුම් අත්හිට වූයේ කවර නෛතික පදනමක් මතද?

(ii) ඔබගේ ඉහත කී ක්‍රියා කලාපය සහ ක්‍රියා ඉහත කී පරිදි 1995 ජුනි මස 30 වන දින පැවැත්වූ කලින් පුවත්පත් සාකච්ඡාවේදී ඔබ දැරූ ස්ථාවරය සැළකිය යුතු ලෙස ආපසු කරකැවීමක් බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) එවැනි සැලකිය යුතු ආපසු කරකැවීමක් කළේ එවකට සෙත් ආයතනයේ සාමාජිකයකු වශයෙන් ඔබට විරුද්ධව ක්‍රියා කිරීමට වූ කොන්දේසිය අභිමුඛයේ ඔබේ පුද්ගලික යහපත උදෙසා බව ඔබ පිළිගන්නේ නැද්ද?

28. (i) 1995 ජුනි මස 28 වන දින හිල්ටන් සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට පෙර,පැමිණිලිකරු විසින් හිල්ටන් සමථයට අදාළ සියලු වැදගත් ලේඛණ සහ කරුණු සොලිස්ටර් ජනරාල්වරයා මගින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සාක්ෂි වශයෙන් ප්‍රසිද්ධියේ ඉදිරිපත් කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) එකී සමථ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට පෙර,එම ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති කොමිෂන් සභාවේ එකඟතාවය ඇතිව සොලිස්ටර් ජනරාල්වරයා ලිඛිත අනුමතිය දී තිබූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) 1995 ජුනි මස 28 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද 1995 ජුනි මස 21 වන දින අමාත්‍ය මණ්ඩල සන්දේශයේ වෙනත් දේ අතර - "සොලිස්ටර් ජෙනරාල්වරයා මේ සමථය ගැන කොමිෂන් සභාව දැනුවත් කර ඇත." යනුවෙන් ප්‍රකාශ කර ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද"

(iv) 1995 ජූනි මස 28 වන දින සමථ ගිවිසුම් අත්සන් කිරීමෙන් පසුව පැමිණිලිකරු, අත්සන් කර තිබූ සමථ ගිවිසුම් ගැන සොලිසිටර් ජනරාල්වරයා මාර්ගයෙන්, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාව ඉදිරියේ ප්‍රසිද්ධියේ සාක්ෂි දී ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද?

(v) පැමිණිලිකරු විසින්, එමගින්, ජනමාධ්‍යවල පුළුල් ප්‍රචාරයක් දී තිබූ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ප්‍රසිද්ධ විභාගවලට පෙර, හිල්ටන් සමථ ගිවිසුම් නිමකිරීම සහ අවසාන වශයෙන් සකස් කිරීම පිළිබඳ කටයුතු, සම්පූර්ණ අනාවරණය කිරීම් සහිතව සිදුකර ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද?

(vi) පාරදෘශ්‍යභාවය පිළිපැදීමට රජයට ඇති ගැඹුරු සහ සුපැහැදිලි කැපවීම ගැන නොසලකා, රජයේ කොන්ත්‍රාත්තු අවසාන වශයෙන් සකස් කිරීමේ හා නිම කිරීමේ රජය අනුගමනය කරන සාමාන්‍ය සිරිත සහ පටිපාටිය එසේ නොවන බව ඔබ පිළිගන්නේ නැද්ද?

(vii) හිල්ටන් සමථ ගිවිසුම තරම් ප්‍රසිද්ධ අනාවරණය කිරීම් සහ පාරදෘශ්‍යභාවයක් නොමැතිව කලම්බු ගෑස්, ඔබියන්ට් ලංකා, කොටගල එයාර් ලංකා, තවක්කාල් ආදිය වැනි වෙනත් කොන්ත්‍රාත්තු/ගිවිසුම් කීපයකට රජය ඇතුළත් වී ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද?

(viii) අසතුටුදායක කොන්දේසි ගණනාවක්ම තිබූ බවට ප්‍රකට කොළඹ ගෑස්, ඔබියන්ට් ලංකා, කොටගල, එයාර් ලංකා, තවක්කාල් ආදිය හා සම්බන්ධ ගිවිසුම් ඒ හා සමානව අත්හිටුවීමට මැදිහත් නොවුනේ මන්ද?

29. (i) යොමු අංක. ඒ/05/26 දරණ ලිපි ගොනුවෙහි නොයෙකුත් සංදේශ සහ සටහන් සාක්ෂි දරණ පරිදි, මුදල් අමාත්‍යාංශයේ ලිපිගොනු වල ඇති නොයකුත් සංදේශ පත්‍ර සහ සටහන් වලින් සාක්ෂි දරන පරිදි, ඇති කරගත් කථා බහ සහ එළඹෙන ලද සමථය ගැන මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ ගරු මුදල් අමාත්‍යවරයා යන දෙදෙනාම කෙලින්ම සහ අනියම් වශයෙන් සම්පූර්ණයෙන්ම දැන සිටි බවත් ඒවාට සම්බන්ධ වූ බවත් ඒවා අවසාන වශයෙන් තීරනය කළ බවත්, ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) සමථ කථා බහ, මුදල් අමාත්‍යාංශයේ ලේකම්/මුදල් අමාත්‍යවරයා/රජය වෙනුවෙන් ක්‍රියා කළ නීතිපතිවරයා සහ/හෝ සොලිසිටර් ජෙනරාල්වරයා ඉදිරිපිට පැවැත්වූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

30. (i) ඔබගේ ඉහත කී ක්‍රියා කලාපය, ක්‍රියා සහ ප්‍රකාශ, ජාතික සම්පත් එසේ කොල්ලකෑම සහ ගසා කෑම වැලැක්වීමට ව්‍යවස්ථාපිතව බැඳී සිටි පරිදි ක්‍රියා කිරීමට සිතාමතාම සහ උවමනාවෙන්ම පැහැර හැර සහ අතපසු කළ සෙත් ආයතනයේ සාමාජිකයන් වශයෙන්, වෙනත් අය අතර, ඔබට විරුද්ධව ක්‍රියා කිරීමට රජයට කැපවීමක් ඇති කළ අංක. 3 දරන සමථ ගිවිසුමේ කොන්දේසිය ඔබ විසින් සොයා ගැනීමේ සෘජු ප්‍රතිඵලයක් බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) 1996 ඔක්තෝබර් මාසයේදී සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේදී 1996 ඔක්තෝබර් මාසයේදී ලියා අත්සන් කරන ලද පරිශිෂ්ඨයක් මගින් සමථ ගිවිසුම් වලින් බැහැර කරන ලද එකම කොන්දේසි නිශ්චිතවම ඔබට අදාළවූ සහ ඔබට පුද්ගලිකව බලපෑ ඉහත කී කොන්දේසිය පමණක් බව ඔබ පිළිගන්නේ නැද්ද?

31. (i) 1995 අගෝස්තු මස 08 වන දින ඔබ පාර්ලිමේන්තුවට කළ ඉහත කී ප්‍රකාශයේ තවදුරටත් "කෙසේ වුවද, ඊටපසුව, මේ සමථ ක්‍රියාවලියේදී, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් අත්සන් කරන ලද ගිවිසුම් වලින් පිළිගත නොහැකි ස්වභාවයක වූ බැදීම් ගණනාවකට රජය යටත් කර ඇති බව නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා විසින් සොයාගෙන මුදල් අමාත්‍යවරයාට දන්වන ලදී" යනුවෙන් ඔබ වැඩිදුරටත් ප්‍රකාශ කළ බව පිළගන්නේ නැද්ද?

(ii) එම ප්‍රකාශය සකස් කිරීමේදී, සමථ කාරණා මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයා සහ මුදල් අමාත්‍යවරයා හොඳින් දැන සිටි බව පැහැදිලිව අනාවරණය කෙරෙමින්,වෙනත් දේ අතර කථා බහ වලට අදාළ සංදේශ සහ සටහන් පිළිබඳව සාක්ෂි අඩංගු වූ මුදල් අමාත්‍යංශ යොමු අංක. EA/05/26 දරණ ලිපිගොනුවේ අදාළ ලේඛන ඔබ පරීක්ෂා කලේ නැද්ද?

32. (i) 1995 අගෝස්තු මස 8 වන දින පාර්ලිමේන්තුවට කළ ප්‍රකාශයේ, වෙනත් දේ අතර, එළඹෙන ලද හිල්ටන් සමථ ගිවිසුම් වලින් රජයට පිළිගත නොහැකි බැදීම් ගණනාවකට රජය යටත් කරනු ලැබූ බව ප්‍රකාශ කර තිබූ බවත් නිශ්චිතව පැමිණිලිකරුට පමණක් අදාළ වූ එක් නිශ්චිත බැදීමක් ගැන, සමථ ගිවිසුම් වල පැහැදිලිව දක්වා තිබූ පරිදි යටත්වීමට රජයේ බැදීම අවශ්‍ය වූ අවස්ථාගත කරුණු හෙළි නොකර, සඳහන් කළ බවත් නොමග යැවීම සඳහා එම කාරණය වසන් කිරීමට ඔබ උවමනාවෙන්ම තෝරා ගත් බවත් ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) රජයට පිළිගත නොහැකි බැදීම් ගණනාවක් තිබූ බව ඔබ ප්‍රකාශ කරන ලදුව, එසේ රජයට පිළිගත නොහැකි වූ කොන්දේසි/බැදීම් හඳුන්වාදීම හඳුන්වාදීමට ඔබ වුවමනාවෙන්ම පැහැර හැර අතපසු කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

33. (i) ඔබද ඇතුලත්ව සෙක් ආයතනයේ එවකට සිටි සමාජිකයන්ට විරුද්ධව රජය විසින් ක්‍රියා කළ යුතු බවට සමථ ගිවිසුමේ ඇති කොන්දේසිය අනුව සලකා බැලීමේදී, ඔබ ඇත්ත වශයෙන්ම සම්බන්ධතාවක් ඇති සහ බලපෑමට ලක්වූ පාර්ශවකරුවකු බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) ඔබගේ පෞද්ගලික සම්බන්ධතාවය සහ ඔබට ඇතිවූ බලපෑම ඔබ උවමනාවෙන්ම වසන් කළ බවත් පාර්ලිමේන්තුවට සහ එමගින් මහජනතාවට ඔබ එය හෙළිදරව් නොකළ බවත් ඔබ පිළිගන්නේ නැද්ද?

34./

34. (i) ඔබ විසින් පැමිණිලිකරුට අදාළ එක්තරා ඡේදයක මැද කොටස පමණක්, එහි පද සම්බන්ධතාවය නොමැතිවද හුවා දක්වමින් එහි ප්‍රථම සහ පසු කොටස් අත්හැර දමා එය පිළිගත නොහැකි කොන්දේසියක් වශයෙන් හඳුන්වමින් ද ගෙනහැර දැක්වීමෙන් ඔබේ ඉහත කී ප්‍රකාශය සිතා මතාම මුවමනාවෙන්ම සහ දැන දැනම කළ අසත්‍ය සහ නොමග යවන සුළු ප්‍රකාශයක් බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) මෙය හිල්ටන් සමථයට අගතියක් සිදු කිරීමේ සහ එය අසාර්ථක කිරීමේ සිතා මතාම ඇති කරගත් චේතනාවෙන් උවමනාවෙන්ම, ඔබේ පෞද්ගලික සම්බන්ධතාවය සහ ඔබට ඇතිවූ බලපෑම නිසා, හිතා මතාම කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) ඔබ විසින් එසේ කළ ඉහත කී නොමග යවන සුළු ප්‍රකාශය නිවැරදි කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරු ඔබට නිශ්චිතවම ඒ ගැන දන්වා ලිපි ලියුවත්, ඊට පසුව කවර හෝ කිසිම අවස්ථාවක එහි නිවැරදි කිරීමක් ඔබ නොකළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

35. (i) සියලුම කරුණු සම්පූර්ණයෙන් සතුව සිටි මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා, මුදල් අමාත්‍යවරයා වශයෙන් ජනාධිපති කුමාරතුංග මැතිණිය විසින් දෙන ලද විධානය මත, පාර්ලිමේන්තුවේ ඉහතකී ප්‍රශ්නයට උත්තරයක් වශයෙන් දීම සඳහා සත්‍ය සහ නිවැරදි කරුණු දක්වමින් 1995 සැප්තැම්බර් මස 18 වන දිනැති <u>නිල උත්තරයක්</u> පිළියෙල කර තිබූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) පාර්ලිමේන්තුවේ මතු කරන ලද ප්‍රශ්න වලට උත්තර පිළියෙල කිරීම සඳහා අමාත්‍යාංශය විසින් අනුගමනය කරන සාමාන්‍ය පරිපාලනමය ක්‍රමය සහ කාර්ය පටිපාටිය එය බව ඔබ පිළිගන්නේ නැද්ද? එසේ නැත්නම් සාමාන්‍ය ක්‍රමය සහ කාර්ය පටිපාටිය කුමක්ද?

(iii) 1995 සැප්තැම්බර් 18 වන දින දරන එම සත්‍ය සහ නිවැරදි නිල උත්තරය ඔබ විසින් උවමනාවෙන්ම ප්‍රතික්ෂේප කර, දන්නා කරුණු වලට පටහැනිව, 1995 සැප්තැම්බර් මස 19 වන දින පාර්ලිමේන්තුවට ඔබගේම උත්තරය ප්‍රකාශ කල බව ඔබ පිළිගන්නේ නැද්ද?

36. (i) 1995 දෙසැම්බර් මස 15 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී දොස්තර රාජිත සේනාරත්න විසින් ප්‍රකාශයේ අනාවරණය කළ කාරණාවලට පටහැනි කරුණු ඉදිරිපත් කිරීමට සහ/හෝ ඒවා අසත්‍ය යැයි ඔප්පු කිරීමට නොහැකි වූ බව පිළිගන්නේ නැද්ද?

(ii) ආචාර්ය රාජිත සේනාරත්න විසින් ඔහුගේ එකී ප්‍රකාශයේ අනාවරණය කළ නොයෙකුත් කරුණු වලට පටහැනිව කරුණු ඉදිරිපත් කිරීමට සහ/හෝ ඒවා අසත්‍ය යැයි ඔප්පු කිරීමට ඔබට නොහැකි වීමෙන් දොස්තර රාජිත සේනාරත්න විසින් ඔහුගේ එකී ප්‍රකාශයේදී අනාවරණය කළ දේ කරුණු වශයෙන් සත්‍ය සහ නිවැරදි බවද ඔප්පු වූයේ යැයි ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) එකී ප්‍රකාශය ඉදිරියේ 1995 අගෝස්තු මස 8 වන දින සහ 1995 සැප්තැම්බර් මස 9 වන දින පාර්ලිමේන්තුවට කරන ලද ඉහත කී අසත්‍ය සහ නොමග යවන සුළු ඔබේ ප්‍රකාශ වල කවර හෝ නිවැරදි කිරීමක් කිරීම ඔබ සිතා මතාම පැහැර හැර අතපසු කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

37. (i) දොස්තර රාජිත සේනාරත්න මහතාගේ එකී ප්‍රකාශයේ ඔහු විසින් සඳහන් කළ එක් කරුණක් වූයේ අර්බුදයක් ඇති කිරීමේ සහ ප්‍රධාන වශයෙන් රජයේ සම්බන්ධතා ආරක්ෂා කිරීමට කොළඹ දිසා අධිකරණයේ අංක.4414/විශේෂ දරණ නඩුවේදී භාණ්ඩාගාරයේ ලේකම්වරයා වශයෙන් මුදල් අමාත්‍යංශයේ එවකට සිටි ලේකම් ඒ.එස්.ජයවර්ධන මහතා විසින් දිවුරුම් ප්‍රකාශයක් ගොනුකිරීම නිසා, 1995 නොවැම්බර් මාසයේදී ඔහුට ඉල්ලා අස්වීමට බල කිරීම ඔබේ ක්‍රියා කලාපය සහ ක්‍රියා බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) මුදල් අමාත්‍යවරයා එකී දිවුරුම් ප්‍රකාශය පරීක්ෂා කර බලා ඒ.එස්.ජයවර්ධන මහතාට වරද නොපැටවූ බවත්; ඊට පටහැනිව ඔහු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වශයෙන් ඉහළ තනතුරකට පත්කළ බවත්, ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) අධිකරණ සහ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා කටයුතු අමාත්‍යවරයා වශයෙන් ඔබගේ ඉහත කී ක්‍රියා කලාපය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 116 වන ව්‍යවස්ථාව අනුව අනිසි බව ඔබ පිළිගන්නේ නැද්ද?

38. (i) ඒ කාලයේදීම හෝ ඒ ආසන්නයේදී 1995 අගෝස්තු මස 24 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර මහතා නිශ්චිතවම හිල්ටන් කාරණයට අදාළව ඇතැම් ප්‍රශ්න ඔබෙන් ඇසූ බවත්, වෙනත් දේ අතර, එක් ප්‍රශ්නයක් රජයෙන් ලබාගත් පහසුකම් සඳහා හොංකොංහි බැංකු ගිණුමකට ජපන් යෙන් මිලියන 340 ක (ආසන්න වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 170 ක) උද්දේශිත ගෙවීමක් සම්බන්ධයෙන් වූ බවත් එය ඉතා විශාල අල්ලසක් වශයෙන් සිතිය හැකි යැයි ව්‍යංගවූ බවත් ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර මහතාගේ ප්‍රශ්න වලට ඔබ පිළිතුරු නොදුන් බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) එම නිසා පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර මහතා 1995 නොවැම්බර් මස 20 වන දිනැති ලිපියක්, වෙනත් දේ අතර, "තත්ත්වය පැහැදිලිව පෙන්වා දෙමින්, මගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරන ලෙස මම ඉල්ලා සිටිමි. මෙය නොකළහොත් රජය පිළිතුරු නොදී ප්‍රශ්නය මග හරින බව කරුණු දන්නා තැනැත්තන් සැක කරනු ඇතැයි මම සිතමි" යනුවෙන් ප්‍රකාශ කරමින් ඔබට ලියුවේ නැද්ද?

(iv)/

(iv) ඔබ විසින් පිළිගත් පරිදි 1995 ජූනි මස 30 වන දින පුවත්පත් සාකාච්ඡාවේදී අල්ලස සහ දූෂණය පිළිබඳ ස්ථිර කොමිෂන් සභාව විසින් නෛතික ආයතන සමග දණ්ඩනීය ක්‍රියා මාර්ගයක් ගන්න බව ප්‍රකාශ කළ ඔබ මේ සම්බන්ධයෙන් ගත් ක්‍රියා මාර්ගය කුමක්ද?

39. (i) 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ හිල්ටන් සමර් ගිවිසුම් වලට, නීතිපතිවරයා විසින් සකස් කර අවසන් කරන ලද පරිශිෂ්ටයක් ජපන් සමාගම් (මිට්සුයි/තායිසේ) සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්/මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ පැමිණිලිකරු විසින් සහ අතර ලියා 1996 ඔක්තෝබර් මස අත්සන් කිරීමට යෙදුණු බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද?

(ii) 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ හිල්ටන් සමර් ගිවිසුම්, අන්‍යොන්‍ය වශයෙන් අදාළ වූද, අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධ වූද, අන්‍යොන්‍ය වශයෙන් එකිනෙකට රැඳී සිටින්නා වූද, 1 සිට 4 දක්වා වූ ගිවිසුම් සංඛ්‍යාවකින් සැදුණු, එක් සංධාන සමර්යක අත්‍යාවශ්‍ය කොටස් බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද?

(iii) එකී සමර් ගිවිසුම් වලට වූ 1996 සැප්තැම්බරයේදී/ඔක්තෝබරයේදී ලියා අත්සන් කරන ලද ඉහත කී පරිශිෂ්ටය යටතේ, ජපන් සමාගම් (මිට්සුයි/තායිසේ) විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට/භාණ්ඩාගාරයේ ලේකම්ට, අවලංගු කළ නොහැකි, ස්ථිර සහ නිශ්චිත ඇටෝර්නි බලපත්‍රයක් දී තිබෙන බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද?

(iv) එකී ඇටෝර්නි බලපත්‍ර මගින්, අංක.3 හා 4 දරණ ගිවිසුම්වල අන්තර්ගත පූර්වග කොන්දේසි ක්‍රියාත්මක කිරීමේ නිශ්චිත කාර්යය සඳහා ජපන් සමාගම් (මිට්සුයි/තායිසේ) විසින් දරනු ලබන එච්ඩීඑල් සමාගමේ කොටස් ධාරිතාවෙන් 15% ක ප්‍රමාණයක් මත ඡන්දය දීමට භාණ්ඩාගාරයේ ලේකම්ට සහ/හෝ ඔහුගේ නියෝජිතයාට අධිකාරය හා බලය දී ඇති බව ඔබ පිළිනොගන්නෙහිද?

(v) එමගින්, එච්ඩීඑල් සමාගමේ කොටස් ධාරිතාවෙන් 80% ක ඡන්දය දීමේ අයිතිවාසිකම, එකී පරිශිෂ්ටය මගින් විශේෂයෙන් බැහැර කරන ලද එක් කොන්දේසියක් හැරෙන්නට එකී අංක. 1 සිට 4 දක්වා වූ සමර් ගිවිසුම්වල අන්තර්ගත සියලු කොන්දේසි ඉටු කිරීම සහතික කිරීම පිණිස, රජය නියෝජනය කරන, මුදල් අමාත්‍යාංශයේ ලේකම්/භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරීම පිණිස. පැමිණිලිකරු විසින් සාකච්ඡා කරන ලද බව සහ ඒ අයිතිය එලෙස ලබාගත් බව ඔබ පිළිනොගන්නෙහිද?

(vi) එකී පරිශිෂ්ටය මගින්, එකී සමර් ගිවිසුම් වලින් බැහැර කරනු ලැබූ එකම වැදගත් කොන්දේසිය නම්, සෙත් ආයතනයේ සාමාජිකයන්ට විරුද්ධව කටයුතු කිරීමට රජය විසින් ගැනීමට තිබූ ක්‍රියාවන්ට අදාළ (මෙහි පහත දැක්වෙන) අංක.3 දරණ ගිවිසුමේ අංක.5 දරණ වගන්තිය පමණක් බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ? එසේ නම් ඒ කෙසේද?

"5. එච්ඩීඑල්/

"5. එච්ඩීඑල් සමාගමට අදාළ කාරණා සම්බන්ධයෙන් අමරසේකර මහතා විසින් එකී ආයතන වෙත කරන ලද නියෝජනයන්ට අදාළව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ/හෝ ඒ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ සහ කොළඹ කොටස් වෙළඳපොළේ සහ/හෝ එහි අධ්‍යක්ෂවරයන්ගේ ක්‍රියාකලාපය හා ක්‍රියාවන් සම්බන්ධයෙන් රජය විසින් නිසි සහ ස්වාධීන ක්‍රියා මාර්ගයක් ගත යුතු අතර, එකී කාරණා සම්බන්ධයෙන් දිගටම ක්‍රියා කරගෙන යාමේ අයිතිය අමරසේකර මහතා විසින් තමා වෙත ද, රඳවා තබාගනු ඇත."

(vii) ඉහත කී කොන්දේසිය බැහැර කිරීමට පැමිණිලිකරු එකඟ වූයේ, අධිකරණ අමාත්‍යවරයා වශයෙන් සහ නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා වශයෙන් සියල්ලන්ම ඔබගේ විෂය පථය යටතට වැටෙන වත්මන් නීතිපතිවරයා වූ, ජනාධිපති නීතිඥ සරත් සිල්වා මහතාගේ, එවකට මුදල් අමාත්‍යාංශයේ ලේකම් වූ බී.සී.පෙරේරා මහතාගේ සහ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ආචාර්ය පී.බී.ජයසුන්දර මහතාගේ දැඩි ඉල්ලීම මත බව ඔබ පිළිනොගන්නෙහිද?

(viii) පරිශිෂ්ටය සහ ඒ පරිශිෂ්ටය යටතේ ජපන් සමාගම් (මිට්සුයි සහ තායිසේ) විසින් දෙන ලද වෙනස් කළ නොහැකි ඇටෝර්නි බලපත්‍රය යටතේ සහ ඒවායේ නියමයන් පරිදි, ඉහත 39(vi) විචාරණයේ සඳහන් එක් කොන්දේසියක් හැර, 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ අංක.1 සිට 4 දක්වා වූ සමථ ගිවිසුම්වල සියලු කොන්දේසි ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට රජය එකඟ වූ බව සහ පොරොන්දු වූ බව ඔබ පිළිනොගන්නෙහිද?

(ix) 1996 ඔක්තෝබරයේදී එකී සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට <u>පෙරාතුව</u>, 1995 අගෝස්තු මස 08 වන දින ඔබ විසින් පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශයෙහි රජයට පිළිගත නොහැකි එක් කොන්දේසියක් ලෙස ඔබ විසින් හඳුන්වනු ලැබූ <u>අංක.3 දරණ සමථ ගිවිසුමේ ඒ කොන්දේසිය ම ඔබගේ එම ප්‍රකාශය අසත්‍ය බවට පත් කරමින්, 1996 සැප්තැම්බර්/ඔක්තෝබර් මාසයේදී නීතිපතිවරයා විසින් බලාත්මක කොට ක්‍රියාත්මක කරන ලද බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද?</u>

40. (i) ඔබ විසින් නීති විරෝධී ලෙස සිදු කරන ලද හිල්ටන් සමථ ගිවිසුම් අත්හිටවීම ඉවත් කර ගැනීම සම්බන්ධයෙන්, නීතිපතිවරයා විසින් අනුමත කරන ලද පරිදි වූ ප්‍රකාශයක් සහ කලින් ඇතිකර තිබෙන වැරදි අවබෝධ නිවැරදි කරමින් අදාළ කරුණු පිළිබඳව සත්‍ය හා නිවැරදි ප්‍රකාශයක් 1996 දෙසැම්බර් මාසයේදී මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව කාරක සභා අවස්ථාවේදී සාකච්ඡා කරන විට පාර්ලිමේන්තුවට කරන ලෙස ඔබට නියම කර තිබූ බව ඔබ පිළිනොගන්නේද?

(ii) ඔබ හිතාමතාම එසේ කිරීම පැහැර හැරිය බව සහ නොසලකා හැරිය බව ඔබ පිළිනොගන්නේද?

41. (i) එච්ඩීඑල් සමාගමේ සභාපති සහ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ඩී.වයි.ලියනගේ මහතා, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හා එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂ පී.බී.ජයසුන්දර මහතා, විසින් අත්සන් කරන ලද්දා වූද, එච්ඩීඑල් සමාගමේ ලේකම්වරුන් විසින් 1997 නොවැම්බර් මස 07 වන දින සංසරණය කිරීමට සලස්වන ලද්දා වූද, එච්ඩීඑල් සමාගමේ ත්‍රෛමාසික ගිණුම් වලින්, ප්‍රමාදය සඳහා පොලිය වශයෙන් එච්ඩීඑල් සමාගම විසින් ජපන් යෙන් 156,478,693 ක (ශ්‍රී ලංකා රු.79,629,171/- ක) අතිරේක මුදලක් ගෙවා ඇති බැව් අනාවරණය වූ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද?

(ii) එච්ඩීඑල් සමාගමට ගෙවන්නට සිදු වූ එකී අතිරේක පොලිය එසේ දරන්නට සිදු වූයේ හිල්ටන් සමථය ඔබ විසින් නීතිවිරෝධී ලෙස අත්හිටවීමට සැලසූ නිසා බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද?

42. හිල්ටන් සමථය ඔබ විසින් නීති විරෝධී ලෙස අත්හිටවීමට සැලසූ නිසා, පැමිණිලිකරු විසින් තත් කාර්ය සඳහා විශේෂිතවම සාකච්ඡා කොට ලබාගත් ඉතිරි ණය මුදල ආපසු ගෙවීම උදෙසා වූ එක් අවුරුදු ක්ෂමා කාලසීමාව තුළදී, අංක.2 දරණ සමථ ගිවිසුමේ 13 වන හා 14 වන වගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි, එච්ඩීඑල් සමාගමේ මූල්‍ය කටයුතු තාවදුරටත් ප්‍රතිව්‍යුහගත කිරීම ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව ඔබ පිළිනොගන්නෙහිද?

43. (i) එච්ඩීඑල් සමාගමේ ඉහත කී ත්‍රෛමාසික ගිණුම් වලින්, 1997 ජූලි මස 01 වන දින ජපන් සමාගම් වලට (මිට්සුයි හා තායිසේ) ගෙවීම් කිරීම පිණිස එච්ඩීඑල් සමාගම වෙනුවෙන්, රු.288,567,634 ක අතිවිශාල මුදලක් රජයට ගෙවීමට සිදු වූ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද ? එසේ නම්, ඒ කෙසේද?

(ii) ඉහත සඳහන් කරන ලද පරිදි, මහජන මුදල් භාවිතා කරමින් එවැනි අතිවිශාල මුදල් සම්භාරයක් රජයට ගෙවන්නට සිදු වූයේ හිල්ටන් සමථය ඔබ විසින් නීති විරෝධී ලෙස අත්හිටවීමට සැලැස් වූ නිසා බවත්, එසේ අත්හිටවීම නිසා ඉහත සඳහන් කරන ලද පරිදි, එච්ඩීඑල් සමාගමේ මූල්‍ය කටයුතු තාවදුරටත් ප්‍රතිව්‍යුහකරණය වළක්වන ලද බවත්, ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද?

44. සඳහන් කරන ලද අවස්ථාගත කරුණු අනුව, එච්ඩීඑල් සමාගමට/රජයට එලෙස අලාභ සිදු කිරීම, 1994 අංක.20 දරණ අල්ලස් (සංශෝධන) පනත යටතේ අර්ථ නිරූපණය කර ඇති "දූෂණය" යන්නෙහි අර්ථය තුළට වැටෙන බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද?

45. (අ) හිල්ටන් සමථය පිළිබඳ ඔබගේ ඉහත කී ප්‍රකාශ කිරීමට ප්‍රථම, මුදල් අමාත්‍යාංශයේ යොමු අංක. EA/05/26 දරණ ලිපි ගොනුවේ ඇති කාරණයට අදාළ සියලු ලියකියවිලි හා ලේඛන ඔබ විසින් පිරික්සා බලා දැනගත යුතුව තිබුණු බව දැනගත යුතු බව ඔබ පිළිනොගන්නෙහිද?

(ආ)/

(ආ) ඒ අනුව :

(i) සමථයේ නියමයන්, 1995 ජූනි මස 28 වන දින එළඹෙන ලද සමථ ගිවිසුම්වල ඇතුළත් සියලු කොන්දේසි පිළිබඳව නීතිපතිවරයා/ඔහුගේ නිළධාරීන් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්/ඔහුගේ නිළධාරීන් ඉදිරිපිට දී 1992 ඔක්තෝබර් මස එකඟ වූ බව ;

(ii) ගිවිසගත් සමථ නියමවල පදනම මත පසුව 1993 දී නීතිපතිවරයා විසින් සමථ ගිවිසුම්වල කටයුතු සමාප්ත කළ බව ;

(iii) පසුව 1994 ජූනි වලදී, නීතිපතිවරයා විසින් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කරුණු පැහැදිලි කර දීමෙන් පසු විජේතුංග ජනාධිපතිතුමා විසින් සමථ ගිවිසුම් අනුමත කිරීමට යෙදුණු බව සහ ඒවා ක්‍රියාවේ යොදන ලෙස මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට හෝ ඔහු නොමැති නම් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ට අධිකාරය හා බලය දුන් බව ;

(iv) එච්ඩීඑල් සමාගම ණයකරු වූයේ වී නමුදු, ඇපකරු වශයෙන් සිටින ශ්‍රී ලංකා රජයෙන් පොරොන්දු නෝට්ටු ලබා ගැනීමට ජපන් සමාගම් (මිට්සුයි/තායිසේ) විසින් බලකර ඉල්ලා සිටීමේ කොන්දේසිය නිසා පැමිණිලිකරු සමථ ගිවිසුම් ක්‍රියාවේ යෙදවීමට ප්‍රතික්ෂේප කළ බැවින්, එකී සමථ ගිවිසුමේ අවශ්‍ය කරන ලෙසින්ම ක්‍රියාවේ නොයෙදූ බව ;

(v) අනතුරුව ජපන් සමාගම් (මිට්සුයි/තායිසේ) කොන්දේසිය සම්බන්ධයෙන් කණගාටු වූ බැවින්, එච්ඩීඑල් සමාගමේ මූල්‍ය කටයුතු ප්‍රතිව්‍යුහකරණය කිරීමට/එකී සමාගම විසින් ණය මුදල ආපසු ගෙවීම පහසු කරවමින් එහි ණය ප්‍රතිලේඛනගත කිරීමට යටත්ව, කලින් කටයුතු සමාප්ත කර තිබුණු සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම කරගෙන යන ලෙස, මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 1994 ඔක්තෝබරයේදී නීතිපතිවරයා වෙත ලියා යවන ලද බව ;

(vi) 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ අංක. 1 සිට 4 දක්වා වූ සමථ ගිවිසුම් එලෙස කටයුතු අවසන් කර ඇති බව ;

(vii) ඔබ විසින් නීතිවිරෝධීලෙස සමථ ගිවිසුම් අත්හිටුවීමට සැලැස්වීම මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් 1994 ඔක්තෝබර් මස 19 වෙනි දින දරන ලිපියෙන් දෙන ලද විධානය නිෂ්ඵල සහ බලරහිත කල බව ;

ඔබ පිළිනොගන්නේද?

වර්ෂ 1999 ක්වූ අප්‍රේල් මස 28 වෙනි දින දීය.

පැමිණිලිකරුගේ නීතිඥ.